**කටුනායක සීදූව නගර සභාව - 2020**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

කටුනායක සීදූව නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය , වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කටුනායක සීදූව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**--------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් විස්තරාත්මක කළමනාකරණ වාර්තාවේ පහත අංක යටතේ සඳහන් කර තිබූ නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

1.2.1, 1.2.2.(අ)(ආ), 1.2.3, 1.2.4(අ)(ආ), 1.2.5(අ)(ආ), 2.2.2, 2.2.3(අ)(ආ) හා 3.4.1

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 9.9 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 10 යටතේ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලැබීම්වලින් වර්ෂයේ කළ ගෙවීම්, අතිරික්තයේ හඳුනාගත් ප්‍රදාන ලෙස අඩුකොට ඉතිරිය ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ වූ, අතිරික්තයේ හඳුනා නොගත් ප්‍රදාන යටතේ සටහන් කළ යුතු විය. සමාලෝචිත වර්ෂයේ ලැබූ ප්‍රතිපාදනවලින් රු.3,699,215 ක් ගෙවීම් කර තිබුණද ලැබිය යුතු ලෙස සඳහන් රු.23,366,897 ක ප්‍රතිපාදන මුදලම සටහන් අංක 05 යටතේ අයභාරය ලෙස ගිණුම් ගත කර සටහන් අංක 10 යටතේ අතිරික්තයේ හඳුනා නොගත් ප්‍රදාන යටතේ ඉතිරියක් ලෙස කිසිදු මුදලක් දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අංක 18.3 ප්‍රකාරව 2020 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිතිවලට (SLFRS) අනුව පිලියෙළ කල ප්‍රථම මූල්‍ය ප්‍රකාශන බවට පැහැදිලි හා සීමා රහිත ප්‍රකාශනයක් සිදුකර නොතිබුණි. | ඉදිරි වර්ෂවලදී නිවැරදිව ඉදිරිපත් කරන බව දන්වමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | අංක 18.7 හා LGD/10A/ 4/න.ගි./2019 අංක දරන පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 දිනැති ලිපිය ප්‍රකාරව සභාවට අයත් සියළුම ස්ථාවර වත්කම් වටිනාකම් ගිණුම්ගත කළ යුතු වුවත් පිඹුරුපත් ඇති ඉඩම් හා මෝටර් වාහන වටිනාකම පමණක් තාවකාලිකව තක්සේරු කර ගිණුම් ගත කර තිබුණි. සභාව සතු අනෙකුත් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය නොකොට පළාත් පාලන ආයතන සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති වෙත පිවිසීමට පෙර වූ වටිනාකම් මත ගිණුම් ගත කර තිබුණි. | 2021වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට සියළු වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර ඉදිරිපත් කරන බව දන්වමි. | |

**1.6.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ප්‍රතිපත්ති අංක 3.2 යටතේ පරිගණක සියයට 15 ක්, පරිගණක උපාංග සියයට 12.5 ක්, යන්ත්‍ර සියයට 5 ක් හා ලී බඩු සවිකිරීම් සියයට 5 ක් ක්ෂය විය යුතු ලෙස දක්වා තිබුණද 2020 වර්ෂයේ මිලදී ගනු ලැබූ මුළු වටිනාකම රු.3,653,277 ක් වූ පරිගණක, ස්ථාවර වත්කම් උපලේඛනයේ යන්ත්‍ර යටතේද, රු.351,724 ක් වටිනා ජාලකරණ පද්ධතිය, ලී බඩු සවිකිරීම් යටතේ ද වර්ගීකරණය කර එම වත්කම්වලට අදාල ක්ෂය අනුපාතයක් යටතේ ක්ෂය කර තිබුණි. | 2021වර්ෂය සඳහා සියළුම ඉතිරි ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට නියමිත අතර එහිදී සියළුම වර්ගීකරණ දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති නිවැරදි ක්ෂය අනුපාතයක් යටතේ ක්ෂය කළ යුතුවේ. |

**1.6.3 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇවරිවත්ත දිනපතා පොළේ බදුකරු විසින් සභාවට ගෙවා තිබූ 2015 වර්ෂයට අදාල හිඟවිදුලි බිල්පත් වටිනාකම රු.183,344 ක් සමුච්චිත අරමුදලට බැර නොකොට සමාලෝචිත වර්ෂයට අදාල ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී මෙවැනි ආදායම් ලද විට සමුච්චිත අරමුදලට බැර වන සේ සටහන් කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සීදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 04 ක් වෙනුවෙන් තවදුරටත් හිඟව තිබුණු රු1,217,857 ක යතුරු කාසි මුදලක්, ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගතකර නොතිබුණි. | මෙම ශේෂය ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | සියළු හිඟ මුදල් ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා රජයෙන් වන පැවරුම් මුළු වටිනාකම රු.29,648,006 ක් වුවද සභාව විසින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සටහන් අංක 10 ට සටහන් කර තිබූ මුළු ආධාරවල වටිනාකම රු.23,366,897 ක් වූයෙන් ව්‍යාපෘති 08 ක් සඳහා වූ රු.6,301,109 ක් අඩුවෙන් සටහන් කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී රජයෙන් වන පැවරුම්වල මුළු වටිනාකම නිවැරදිව සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. | මුළු අධාරවල වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඈ) | පළාත් පාලන ආයතන සඳහාවූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පහදාදීම හා මඟ පෙන්වීම යටතේ වූ EG 3.1 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ණයහිමි හා ලැබිය යුතු වත්කම් ලෙස ගිණුම්ගත කර තිබූ එහෙත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිම නොකළ ව්‍යාපෘති 05 ක මුළු වටිනාකම රු.24,884,956ක් හා ඉකුත් වර්ෂයේ ප්‍රාග්ධන වියදම් යටතේ දක්වා තිබූ වැඩ අවසන් නොවූ කර්මාන්ත 07 ක් සඳහා වන රු.5,140,190 ක අගය, කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පහදාදීම හා මඟ පෙන්වීම් අනුව ගිණුම්ගත කිරීම කළ යුතුවේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව සභාව සතු ටේලර් 31 ක හා ට්‍රැක්ටර් රථයක වටිනාකම, ගිණුම්වලට ගෙන නොතිබුණි. | 2021වර්ෂයේ යන්ත්‍ර ප්‍රත්‍යාගණනයේදී අගය කර ගිණුම්ගත කරන බව දන්වා සිටිමි. | සභාව සතු සියළු වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඊ) | පළාත් පාලන ආයතන සඳහාවූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 9.9 ප්‍රකාරව ක්ෂය කිරීම් ගණනය කළ පදනම මත වූ අගයක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ජර්නල් සටහනක් මඟින් සටහන් අංක 05 යටතේ අයහාරයක් ලෙස දැක්විය යුතු වුවත් එසේ නොකොට ලැබිය යුතු ලෙස සඳහන් රු.23,366,897 ක ප්‍රතිපාදන මුදලම සටහන් අංක 05 යටතේ අයහාරය ලෙස ගිණුම් ගත කිරීම නිසා වර්ෂයේ ආදායම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහාවූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව ගිණුම්ගත කළ යුතුවේ. |

### 1.6.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.16,198,241 ක්වූ ගිණුම් විෂයයකට අදාල ශේෂය හා උපයෝගී ලේඛනයේ දැක්වෙන ශේෂය අතර රු.1,000,869 ක වෙනසක් නිරීක්ෂණය විය. | උපලේඛනය මේ සමග කාරුණිකව ඉදිරිපත් කර ඇති බව දන්වමි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු.199,670,282 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 149,282,566 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හිඟ හිටි වරිපනම් බදු හා කුලී ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයේදී පිළිවෙලින් රු.40,772,000 ක් හා රු.3,689,000 ක් දක්වා වැඩිවී තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට හිඟයෙන් අය කර ගෙන තිබූ මුදල පිළිවෙලින් රු.27,887,773 ක් හා 159,779 ක් විය . | කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් බල ප්‍රදේශය වසා තැබීම මෙම හිගය ඇති වීමට හේතුවී ඇති බව දන්වමි. | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුවේ. |

#### 2.2.2 කුලී

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සීදූව නව වෙළඳ සංකීර්ණයේ පැරණි වෙළඳ සැල් හිමියන්ට ලබාදී තිබූ කඩ කාමර 12 කින් වසර 2 ක් සඳහා පමණක් 2000 දෙසැම්බර් 09 දිනැති තක්සේරුවෙන් සියයට 50ක මුදලක් අය කිරීමට සභාව විසින් අනුමැතිය ලබාදී තිබුණද, සභා අනුමැතීන් මත 2010 වර්ෂයේ සිට 2018 අගෝස්තු දක්වා | සභා අනුමැතිය මත සියයට 50 ක් අය කිරීමට අනුමැතිය ලැබී ඇති බව දන්වමි. | කුලී ආදායම සංශෝධනය සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | වසර 8 1/2 කට වැඩි කාලයක් එපරිදි අයකිරීම් කර තිබුණි. මෙම කඩ කාමර සඳහා 2017 ජුනි මාසයේ නැවත තක්සේරුවක් ලබාදී තිබුණු නමුත් එම තක්සේරුද ක්‍රියාත්මක නොකොට 2018 අගෝස්තු 17 දිනැති සභා තිරණයක් මත 2018 සැප්තැම්බර් 01 දින සිට එම කඩ කාමරවල කුලිය (සංශෝධනය කර)අඩු කර තිබුණි. | | |
| (ආ) | කටුනායක නව වෙළඳ සංකීර්ණයේ අංක 06, 07, 08, 09 හා 10 දරන කඩ කාමර අයිති බදුකරු විසින් 2010- 2017 කාල පරිච්ඡේදය තුල කුලී මුදල් ප්‍රමාදවී ගෙවීම හේතුවෙන් සභාවට අයවිය යුතු හිඟ දඩ මුදල් රු.1,677,409 ක් 2021 මාර්තු 10 දින වන විටත් අයකරගෙන නොතිබුණි. තවද කඩ කාමර කුලියට දීම සම්බන්ධයෙන් දෙපාර්ශවය විසින් අත්සන් කර තිබුණු ගිවිසුමෙහි වලංගු කාලය 2015 මාර්තු 17 දිනෙන් අවසන් වි තිබුණද නව ගිවිසුමකට එළඹ නොතිබුණි. | අදාල හිග මුදල ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන අතර අදාල ගිවිසුම මේ වන විට අත්සන් කිරීම සඳහා යවා ඇති බව දන්වමි. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු අතර නව ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | ඊදූව අමුණ පාරේ බහුකාර්ය ගොඩනැගිල්ලේ පිහිටි තැපැල් කාර්යාලයක් සඳහා බදුදී තිබූ කඩ කාමරය වෙනුවෙන් 2015 ජූලි 01 දින සිට 2021 මාර්තු 31 දින දක්වා මාසික කුලිය රු.7,500 බැගින් අයකර තිබූ අතර පළාත් පාලන කොමසාරිස්ගේ 2016 නොවැම්බර් 01 දිනැති අංක LGD/13/2016 දරන චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරුගෙන් ලබාගත් තක්සේරුවක් අනුව කුලී මුදල් තීරණය කළ බවට සාක්ෂි නොතිබුණි. | නව තක්සේරුවක් ලබා ගැනීම සඳහා මේ වන විට තක්සේරු දෙපාර්තමේන්තුවට ලිපියක් යොමු කර ඇති බව දන්වමි. | නව තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 අප්‍රේල් සිට 2013 අප්‍රේල් මාසය සඳහා සභාවේ සේවකයන් 24 දෙනෙකුගේ සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් නොගෙවීම හේතුවෙන් සේවක අර්ථසාධක අරමුදල විසින් රු.1,086,228 ක අධිභාර මුදලක් පනවා තිබූ අතර එම මුදල 2020 පෙබරවාරි 20 දින ගෙවා තිබුණි. | අනපේක්ෂිත කාර්යයක් බැවින් හා මෙම දඩ මුදල අධිභාරයක් සේ සැළකීම සම්බන්ධව වගකිවයුතු නිලධාරීන් නම් කර ගැනීම අපහසු කරුණක් වී ඇති බව දන්වමි. | වගකිවයුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සභාවට අයත් සීදූව විලේජ් පොදු ඉඩමේ බාහිර පුද්ගලයෙකුට ව්‍යාපාර කටයුත්තක් සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරිමට 2017 වර්ෂයේ ඉඩදී පසුව එය නවතා දැමීමට නියෝග කිරීම හේතුවෙන් අදාල බාහිර පාර්ශවකරු විසින් තමන් විසින් දරන ලද වියදම් හා තමාට සිදුවූ පාඩුවේ මුළු වටිනාකම වන රු.15,000,000 ක් අයකර දෙන ලෙස ඉල්ලමින් මීගමුව දිසා අධිකරණයේ සභාවට එරෙහිව නඩු පවරා තිබුණි. 2020 දෙසැම්බර් 17 දින වන විට නඩු වාර 09 ක් කැඳවා තිබූ අතර නඩුවට පෙනී සිටීම සඳහා සභාව විසින් නීතිඥවරයාට ගෙවා ඇති රු.490,000 ක නීතිඥ ගාස්තු වගකීම් විරහිතව බාහිර පුද්ගලයන්ට සභාව සතු ඉඩමේ ව්‍යාපාර කටයුතු සඳහා ගොඩනැගිලි ඉදිකිරීමට අවසර දුන් නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.අදාල නඩුව සඳහා පෙනී සිටින නීතිඥවරයා සමඟ සභාව ගිවිසුමකට එළඹ නොතිබූ අතර 2018 අගෝස්තු 17 දිනැති ලේකම්ගේ ලිපිය පරිදි එක් නඩු වාරයකදි ගෙවිය යුතු නීතිඥ ගාස්තුව රු.35,000 ක් ලෙස එකඟවී තිබුණු නමුත් එම මුදල ඉක්මවා විවිධ වටිනාකම්වලින් නීතිඥ ගාස්තු ගෙවා තිබීම හේතුවෙන් නඩු වාර 09 කදී රු.175,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අදාළ නඩුව සඳහා නීතිඥවරයා පත්කර ගැනීම සහ ගාස්තු සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹ නොමැති අතර වරින් වර ඔහු විසින් ලබා දෙනු ලැබූ ඉල්ලීම් වලට අදාළව මුදල් ගෙවීම් කර ඇති බව දන්වමි. | නීතිඥවරයා සමඟ සභාව ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතු අතර නීතිඥ ගාස්තු ගොඩනැගිලි ඉදිකිරීමට අවසර දුන් නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) සභාව සතු අරලිය ලැන්ඩ්ස් පොදු ඉඩමට යාබද ඉඩමේ හෝටල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවශ්‍ය අනුමැතින් ලබා ගැනීමේදී අඩි 29 ක් පළල ප්‍රවේශ මාර්ගයක් අවශ්‍ය බව ප්‍රකාශ කර සභාව සතු පොදු ඉඩමෙන් පර්චස් 05 ක බිම් ප්‍රමාණයක් ලබාගෙන ඒ වෙනුවට ඔවුන් සතු | මෙම හුවමාරුවට අදාළ කරුණු සම්පූර්ණ කර ගත යුතු බැවින් ඉදිරියේදී මේ සම්බන්ධව කටයුතු සිදු කරන බව දන්වමි. | රක්ෂිය රැක ගැනීමට කටයුතු කිරීම මඟින් පරිසර හානිය අවම කිරීමට හා සභාව සතු පොදු දේපළ රැක ගැනීමට කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | ඉඩමෙන් පර්චස් 6.5 ක් සභාවට ලබා දීමට එකඟ වී තිබුණි. හිමිකාර ව්‍යාපාරයට වෙනත් යූ.සී.මාර්ගයක් ඇති බවත් රජය සතු රක්ෂිත කොටස් ප්‍රවේශ මාර්ග සඳහා ලබාදීමේ හැකියාව, හුවමාරු ඉඩමේ නිරවුල් අයිතිය,රජයේ තක්සේරුව අනුව හුවමාරු ඉඩමේ වටිනාකම හා පොදු කටයුතු වෙන් කළ ඉඩම් භාවිතය පිළිබඳ වෙන්දේසි ඉඩම් පදිංචිකරුවන්ගේ අනුමැතීන් යන නීතිමය තත්ත්වයන් හා සංවර්ධනය කිරීමේදී ඇල රක්ෂිත කොටස අහිමිවීමෙන් එම ප්‍රදේශයට වන පාරිසරික හානි ගැන නොසලකා සභාව සතු පොදු ඉඩමෙන් කොටසක් පෞද්ගලික ආයතනයක් වෙත ලබාදීමට 2020 ජූනි 29 වැනි දිනැති සභා රැස්වීමේදී සභාව විසින් ඒකමතිකව තීරණය කර තිබුණි. | | යුතුවේ. |
| (ඇ) | සභාව විසින් මුද්දර ගාස්තු පවරාගැනීම සඳහා ආදායම් කොමසාරිස් වෙත ඉදිරිපත් කර තිබුණු වර්ෂ 2017- 2018 කාලවල මිගමුව හා ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලට අයත් මුද්දර ගාස්තු රු.11.539,400 ක් උපලේඛනවල පැවති විවිධ අඩුපාඩු හේතුවෙන් සභාව වෙත ආපසු පැවරිය නොහැකි බව බස්නාහිර පළාත් පලාත් ආදායම් කොමසාරිස් විසින් දැනුම් දී තිබුණු අතර ආදායම් කොමසාරිස්ගේ උපදෙස් පරිදි අදාල නිවැරදි කිරීම් සිදුකර එම මුද්දර ගාස්තු මුදල පවරා ගැනිම සඳහා 2021 මාර්තු 10 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | අදාල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වෙත ප්‍රවිෂ්ඨ වීමට කොවිඩ් 19 අවධානම මත ඉඩ නොදීම හේතුවෙන් සිදු කර ගත නොහැකි වී ඇති බව දන්වමි. | අදාල නිවැරදි කිරීම් සිදු කර එම මුද්දර ගාස්තු මුදල පවරා ගැනිමට කටයුතු කළ යුතුවේ. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් වසර 20 ක පමණ කාලයක සිට කසළ බැහැර කිරීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් අම්බලම්මුල්ල පිලපිටිය නමැති කුඹුරු ඉඩම භාවිතා කර තිබූ අතර ඒ සඳහා පස් යොදා D5D යන්ත්‍ර මඟින් කසළ තුනී කිරීමට වාර්ෂිකව රු. ලක්ෂ 60 ක පමණ මුදලක් වැය කර තිබුණි. මෙම ඉඩම රජයේ තක්සේරුවක් මත විකිණීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් 2011 වර්ෂයේදී ලිඛිත කැමැත්ත දන්වා තිබියදී හා ඒ සඳහා රජය මඟින්ද ප්‍රතිපාදන වෙන්ව තිබියදී සභාවේ එකඟතාවයන් ලබා ගැනීමේ ප්‍රමාදයන් මත හා කළමනාකරණයේ නොසැලකිල්ල මත | වර්තමානයේ දී මෙම ඉඩම සභාවේ එකඟතාවය මත සභාව වෙත පවරා ගැනීමේ කටයුතු ඉදිරියට සිදු කරගෙන යනු ලබන බව දන්වමි. | සභාව වෙත කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | මෙම ඉඩමේ අයිතිය සභාව සතු කර ගැනීමට වසර 20 ක් යනතෙක් නොහැකිවී තිබුණි. කරුණු මෙසේ තිබියදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් මෙම ඉඩම පවරා දුන් අයෙකුගේ දරුවෙකු වෙත පවරා දීමට 2020 ජනවාරි 27 දින කටයුතු කිරීමෙන් සභාවේ කසළ අපහරණය සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් උද්ගතවී තිබුණි. | | |
| (ආ) | සභාවට අයත් අමන්දොළුව ගොරකරගහකුඹුර නමැති පොදු ඉඩමේ ලොට් අංක 15/ඒ දරන පර්චස් 40 ක බිම් කොටසේ අනවසර ලෙස අයෙකු පදිංචිවී ඇති බව ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය කර ඇති අතර 1979 අංක 07 දරන සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ දින 07 ක් ඇතුළත එහි සන්තකය සභාවට ආපසු ලබා ගැනීමට කටයුතු කරන ලෙස 2019 අගෝස්තු 30 දින ගම්පහ දිස්ත්‍රික් පළාත් පාලන කොමසාරිස් විසින් දන්වා තිබුණද මෙතෙක් එය සභාව සතු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 1979 අංක 07 දරන සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ කටයුතු කිරීම සඳහා පියවර ගෙන ඇති බව දන්වමි. | සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ සභාව සතු කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |